# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 ජනවාරි / පෙබරවාරි**

**සමාජීය විද්‍යා පීඨය**

**දර්ශනය - PHIL - E 2025**

**බටහිර දර්ශනය**

**<u>ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "මානව ශිෂ්ඨාචාරයේ සුවිශේෂී පරිනාමී (භෞතික හා සාමාජීය) ගති ලක්ෂණ ආදී ග්‍රීක දාර්ශනික චින්තනයට පදනම සකස් කරනු ලැබීය." මෙම කියමන හේතු සාධක සහිතව විග්‍රහ කරන්න.

02. ආදී ග්‍රීක චින්තාවන්ට හා ආදී භාරතීය චින්තාවන්ට බලපෑ ස්වාභාවික සහ පාරිසරික අංග ලක්ෂණ පිළිබඳව තුලනාත්මක විමර්ශනයක් කරන්න.

03. සොක්‍රටීස් සිට ඇරිස්ටෝටල් දක්වා දිවෙන දාර්ශනික ධාරාව තුල විද්‍යමාන වන ප්‍රායෝගික සමාජ හා දේශපාලන දර්ශනය පිළිබඳව විචාරාත්මක විග්‍රහයක් සපයන්න.

04. මධ්‍යකාලීන කතෝලික දර්ශනය බිහිවීමට බලපෑ ප්‍රබල සාධකය වූ ආගමික හා දේශපාලනික සුසංයෝජනය (පල්ලිය හා රාජ්‍ය) පිළිබඳ නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

05. <u>එක්කෝ</u>

"බුද්ධිවාදී දාර්ශනික ගුරුකුලය බිහිවූයේ දීර්ඝකාලීනවය පරිණාමය වූ දාර්ශනික ප්‍රවාදයකට ප්‍රතිවාදී පිළිතුරු සැපයීම සඳහාය." මෙම කියමනට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

<u>නැත්නම්</u>

බුද්ධිවාදී හා අනුභූතිවාදී දාර්ශනික ධාරාවන් තුල විද්‍යමාන වන ප්‍රායෝගික ගති ලක්ෂණ පිළිබඳව තුලනාත්මක ඇගැයීමක් කරන්න.

06. මාර්ක්ස්වාදී දර්ශනයේ ඓතිහාසික භෞතික වාදය හා ඓතිහාසික විඥාණවාදය අතර ඇති සම විෂමතා පහදන්න.

07. සාංදෘෂ්ටික වාදයේ ඓතිහාසික පදනම හා හරය සැකවින් විග්‍රහ කරන්න.

08. සාංදෘෂ්ටිකවාදී දර්ශනය අනුව "පරාරෝපණ" සංකල්පය "ඇල්බෙයර් කැමූ" ගේ මහාමාරිය (The Plague) නැමති සාහිත්‍ය කෘතිය මගින් නිරූපණය කරන ආකාරය උදාහරණ සහිතව පහදන්න.

******************************